A

# නිවේදනය

2021.11.17 වන බදාදා දින වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න අසනු ලබන අවස්ථාවේදී ගරු චමින්ද විජේසිරි සහ ගරු හේෂා විතානගේ යන මන්ත්‍රීවරයන් විසින් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඔවුන් දෙදෙනාගේ ප්‍රශ්න ඇතුළත් නොකිරීම සම්බන්ධයෙන් සභා ගර්භයේදී මතු කරන ලද කරුණු සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කිරීමට කැමැත්තෙමි.

පසුගිය කාලයේ කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන දින ගණන සීමාවීම, පැවති සීමිත රැස්වීම් දිනවලදී ද විවිධ හේතුන් නිසා වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ඉදිරි දිනයන්ට කල් දැමීම සහ දිනකට අසනු ලබන ප්‍රශ්න සංඛ්‍යාව 15 සිට 10 දක්වා අඩුකිරීම හේතුවෙන් මන්ත්‍රීවරයන්ගේ ප්‍රශ්න ඇසීමේ අවස්ථාව සැලකිය යුතු ලෙස සීමා වූ බව දැනුම්දීමට කැමැත්තෙමි.

මෙම තත්ත්වයට යම් පිළියමක් ලෙස පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී එළැඹි තීරණය පරිදි ප්‍රශ්න ඇසීම සඳහාම වෙන්වූ විශේෂ පාර්ලිමේන්තු රැස්වීම් දින 3ක් 2021.04.05, 2021.10.04 හා 2021.11.08 දිනවලදී පවත්වා එලෙස එකතුවී තිබූ ප්‍රශ්න 140ක් ඇසීමට අවස්ථාව සලසා දුන් බවත් මෙහිලා විශේෂයෙන් සඳහන් කිරීමට කැමැත්තෙමි.

2021 ඔක්තෝබර් 07 දින පවත්වනු ලැබූ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී "විසර්ජන" (2022) පනත් කෙටුම්පත දෙවැනිවර කියවීමේ විවාදය සහ කාරක සභා අවස්ථාවේ විවාදය පැවැත්වෙන දිනයන්හි දී දිනකට වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 05ක් පමණක් ඇසීමට තීරණය කරන ලදී.

මෙම තත්ත්වය පිළිබඳව විශේෂ අවධානය යොමු කොට මන්ත්‍රීවරයන් සැලකිය යුතු සංඛ්‍යාවකට ප්‍රශ්න ඇසීමට ඉඩකඩ

සැලසීමේ අරමුණ පෙරදැරි කරගෙන 2022 අයවැය විවාදය පැවැත්වෙන කාලසීමාව තුළදී පමණක් ප්‍රශ්න සඳහා වෙන්කරන ලද පැය භාගයක කාලය තුළදී සතියකට එක් මන්ත්‍රීවරයෙකුට එක් ප්‍රශ්නයක් පමණක් වන පරිදි සතියකට මන්ත්‍රීවරයන් තිස් දෙනෙකුගේ ප්‍රශ්න ඇතුළත් කිරීමටත්, එමඟින් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයන් 36 දෙනෙකුගේ ප්‍රශ්න 69 ක්ද, ආණ්ඩු පාර්ශ්වයේ මන්ත්‍රීවරයන් 31 දෙනෙකුගේ ප්‍රශ්න 46 ක්ද, වශයෙන් මුළු මන්ත්‍රීවරයන් 67 දෙනෙකුට ප්‍රශ්න 115ක් ඇසීමට අවස්ථාව සැලසීමට 2021 ඔක්තෝබර් 21 දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී දෙපාර්ශ්වයේම එකඟතාවයෙන් තීරණය කරන ලදුව අදාළ දිනවලදී න්‍යාය පත්‍රයට ප්‍රශ්න ඇතුළත් කිරීමට කටයුතු කර ඇති බව අවධාරණය කිරීමට කැමැත්තෙමි.

එසේ නොමැතිව ප්‍රශ්න සංඛ්‍යාව දිනකට 05 කට සීමා කිරීමේ තත්ත්වය තුල සාමාන්‍ය ක්‍රියා පිලිවෙත අනුගමනය කරමින් ප්‍රශ්න ඇතුලත් කරන ලද්දේ නම් සෑම දිනකම එකම මන්ත්‍රීවරයන් 05 දෙනෙකුගේ ප්‍රශ්න ඇතුලත් වන අතර ඒ අනුව සමස්ත අයවැය විවාදය පැවැත්වෙන කාලය තුළ එකී මන්ත්‍රීවරයන් 05 දෙනෙකුගේ ප්‍රශ්න පමණක් න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීමට සිදුව තිබුණ බවත් මෙම ගරු සභාවේ අවධානයට යොමු කිරීමට කැමැත්තෙමි.